**හිමිකම් රක්ෂණ අරමුදල - 2020**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

හිමිකම් රක්ෂණ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 31 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වැනි වගන්තිය ප්‍රකාරව 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2009 අංක 1 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 41 සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 02 ට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කර වල මුදලින් කල ආයෝජනය වූ රු.29,658,414ක් වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී වර්ෂයේ ආයෝජන රු.97,189,304ක් ලෙස සටහන් කර තිබුණි.තවද කල්පිරීමෙන් ලැබුණු මුදල රු.4,611,700ක් වුවද ඒ වෙනුවට එම ප්‍රකාශයේ ලැබීම් වශයෙන් රු.78,706,067ක් ඇතුලත් කර තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර වල වටිනාකම රු.97,189,304කි. 2018 හා 2019 වර්ෂයන්හි මිලදීගත් බැඳුම්කර වටිනාකම පිළිවෙළින් රු.3,082,528ක් හා රු.65,112,518ක් විය. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජුනි මාසයේ මුළු හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.2,392,560ක් වූ අතර ඉන් සියයට 40ක් වූ රු.957,024ක් රක්ෂණ අරමුදලට බැර විය යුතු වුවද, එයට රු.938,016ක් පමණක් බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.19,008කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 ජනවාරි ආදායම වැඩියෙන් සටහන් වීම නිවැරදි කිරීම සඳහා ජුනි මාසයේ ආදායම අඩුවෙන් සටහන් කිරීම. | ආදායම නිවරුදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදි අරමුදලේ ආදායම රු.8,016,600 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ද එම වරද නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කර ඇත. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | | | |
| | (I) 42 (ඌ), 4 නියෝගය | සෑම මාසයක් අවසානයේදී මුදල් පොතේ හෝ බැංකු ගිණුමේ කිසිදු ශේෂයක් නොතිබිය යුතු වුවද හිමිකම් පිලිබඳ රේජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමේඑක් එක් මාසයක් අවසානයට අවමය රු.204,142ක් හා උපරිමය රු.331,343ක් වශයෙන් මාස 4ක ශේෂයන් පැවතීම. | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට බැරවිය යුතු මුදල් හිමිකම් රෙජිස්ට්‍රාර්ගේ ගිණුමට වැරදීමකින් බැර වීම. | නියෝගවලට අනුකූල විය යුතුය. |
| | (II) 15 (1) නියෝගය | සෑම වර්ෂයකම ජනවාරි මාසයේදී කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික මහාසභා රැස්වීම පැවැත්විය යුතු වුවද 2020 වර්ෂය සඳහා වාර්ෂික මහසභා රැස්වීම පවත්වා නොතිබීම. | නොවැලැක්විය හැකි හේතූන් මත මෙම රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | නියෝග වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (III) 42 "ඌ" නියෝගය | හිමිකම් ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් අරමුදලට මාරු කරන සියයට හතලිහෙන් සියයට විසිපහක් මාසය අවසානයේදී රක්ෂණ අරමුදලේ පරිපාලන කටයුතු සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට බැර කල යුතු වුවද 2020 ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල මාරු කල යුතු එකතුව පිළිවෙළින් රු.772,046ක් හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට බැර කර නොතිබුණි. | මෙම මාස වල කිසිදු ගෙවීමක් අරමුදලේ සිදු වී නොමැති බැවින් අදාල පරිපාලන වියදම් හිමිකම් රෙජිස්ට්‍රාර් වෙත බැර කර නැත. | නියෝගවලට අනුකූල විය යුතුය. |
| **(ආ)** | 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2019/(I) (i) දරන කළමනාකරණවිගණන චක්‍රලේඛයේ 02 ඡේදය | අවම වශයෙන් කාර්තුවකට විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් එකක්වත් පැවැත්විය යුතු වුවද 2020 වර්ෂයේදි එක් රැස්වීමක් පමණක් පවත්වා තිබීම. | නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අවස්ථාව ලැබී නැත. | චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,201,794ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,684,699ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,482,905ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හිමිකම් ලියාපදිංචිකිරීමේ ආදායම රු.8,646,373කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.421,183ක් වුවද සමාලෝචිත වර්ෂයේදී රු.6,414,576ක මුහුණත වටිනාකමක් සහිත භාණ්ඩාගාර බිල්පත් 6ක් කල්පිරී තිබුණු බැවින් 2020 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් පොලිය රු.137,630ක් විය.ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබු පොලිය රු.283,553ක් එනම් සියයට 67කින් අඩු වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේදී භාණ්ඩාගාර බැදුම්කර පොලී ආදායම රු.2,610,701ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.6,969,486ක් වූ බැවින් බැදුම්කර පොලිය රු.4,358,785ක් හෙවත් සියයට 167කින් වර්ධනය වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරිමේ පනත යටතේ ඉඩම් වල අයිතිය ලියාපදිංචි කිරීමේදී ඒ සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනිම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභය සඳහා රජය විසින් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ආවරණය කිරීමේ අරමුණ ඇතිව මෙම අරමුදල පිහිටුවා තිබුණද , අරමුදලේ 2020 ක්‍රියාකාරී සැලැස්ම තුල එම කාර්යය ඉටු කිරිම පිළිබඳ කිසිඳු ඉලක්කගත කාර්යයක් ඇතුලත් කර නොතිබුණි. එසේම හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසානයට වසර 10ක් ඉක්මවුවද මෙම කාලය තුල කිසිඳු හානිපුරණ වන්දියක් ගෙවිම් කර නොතිබුණු අතර 2020 වර්ෂයේ අවසානය දක්වා මෙහෙයුම් වියදම් වලින් පසුව ලැබු මුළු ආදායම ආයෝජනය කිරීම පමණක් සිදු කර තිබුණි. | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන්ද ජනතාව දැනුවත් කරයි. | අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කළ යුතුය. |
| (ආ) | හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02කට වරක් හිමිකම් ආදායම සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලයට එවිය යුතු වුවද අදාල ආදායම් වාර්තා ලබා දී නොතිබුණු නමුත් බැංකු ප්‍රකාශන අනුව ලැබු ආදායම්වල එකතුව රු.5,994,495ක් අරමුදලේ ආදායම ලෙස මුදල් පොතට හා මුල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි.තවද 2020 වර්ෂයේදී හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල 17ක් විසින් සපයන ලද සේවා හා අයකරන ලද ගාස්තු සම්බන්ධයෙන් ආදායම් වාර්තා 69ක් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දී නොතිබුණි. | කාර්යාල විසින් සති2කට වරක් ආදායම් වාර්තා ලබා නොදීම හේතුවෙන් මෙම තත්ත්වය වාර්තා වී ඇත. | ආදායම් නිවැරදිව හඳුනාගැනීම හා ගිණුම්ගත කිරීම කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2018 හා 2019 වර්ෂයන් වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු වටිනාකම වු රු.386,400ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විගණන ගාස්තු කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වියදම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 133 (1) (අ) ප්‍රකාරව අරමුදලේ කාර්යයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට හිමිකම් රක්ෂණ අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරයි. | යොමු ගත මුදල් රෙගුලාසියට අනුකූල විය යුතුය. |